# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1686/52 - 2011 ජනවාරි 01 වැනි සෙනසුරාදා - 2011.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.–බී 10/2009

**විනිමය පාලන පනත (423 වැනි අධිකාරය)**

**7 වැනි වගන්තිය යටතේ නිවේදනය**

(423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනතේ 3 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාගේ විධානයට යටත්ව මේ නිවේදනයෙන් –

(1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ සමාගම්වලට හෝ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති හවුල් ව්‍යාපාරවලට (මෙහි මින්මතු 'එතෙර කාර්යාල' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ශාඛා කාර්යාලයක්, සම්බන්ධීකරණ කාර්යාලයක්, අලෙවිකරණ කාර්යාලයක්, ඒජන්සියක්, ව්‍යාපෘතියක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් ඊට සමාන කාර්යාලයක් පිහිටුවීමේ සහ නඩත්තු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන ගෙවීම් පහත (2) වැනි හා (3) වැනි ඡේදවල නිශ්චිතව සඳහන් විධානවලට අනුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙත සිදු කිරීමට අවසරය ප්‍රදානය කරනු ලැබේ.

එසේ වුව ද, ඉහත ප්‍රදානය කරන ලද අවසරය –

(i) 2007 අංක 7 දරන සමාගම් පනතේ අර්ථානුකූලව ඇපයෙන් සීමිත යම් සමාගමක් ;

(ii) යම් රාජ්‍ය නොවන සංවිධානයක් ;

(iii) (423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනත යටතේ පවරන ලද චෝදනාවක් සම්බන්ධයෙන් නීති කෘත්‍යයක් පවත්වාගෙන යනු ලබන්නේ යම් සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට එරෙහිව ද, එවැනි සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් ;

සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

(2) (1) වැනි ඡේදය යටතේ අවසරය ප්‍රදානය කරනු ලැබුවේ යම් සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ සමාගම හෝ හවුල් ව්‍යාපාරය විසින් –

(i) අදාළ නිර්දේශය නිකුත් කරන අවස්ථාව වන විට වෘත්තීයේ නියැළීමට වලංගු සහතිකයක් හිමි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයකුගෙන් ලබාගත් නිර්දේශයක් ද සහිතව, ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීමට ඇති ශක්‍යතාව පිළිබඳ වාර්තාවක් ද සමඟ, බලයලත් වෙළෙන්දෙකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු බවට ද ;

(ii) කරනු ලබන සියලු ප්‍රතිමුඛ ප්‍රේෂණ විනිමය පාලකවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුව බලපත්‍රලත් වාණිජ බැංකුවක විවෘත කරනු ලබන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් මඟින් පමණක් සිදු කළ යුතු බවට ද ;

(iii) එතෙර කාර්යාලයකින් ලැබෙන සියලු ලාභ, ආන්තිකයන් සහ අතිරික්ත අරමුදල්, මූලික ආයෝජනය සිදුකළ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා එකී ගෙවීමේ දිනයේ සිට මාස තුනක් ඇතුළත ශ්‍රී ලංකාවට දේශප්‍රත්‍යාවර්තනය කළ යුතු බවට ද ;

(iv) ඉහත (i) වැනි අනුඡේදයේ සඳහන් කළ සෑම ඉල්ලීමක් ම, මෙහි දක්වා ඇති කාර්යය සඳහා වෙනත් බලයලත් වෙළෙන්දෙකු හරහා ප්‍රතිමුඛ ප්‍රේෂණයක් නොකළ බවට සඳහන් දිවුරුම් පෙත්සමක් සමඟ ඉදිරිපත් කළ යුතු බවට ද ;

(v) විනිමය පාලකවරයා විසින් බලයලත් වෙළෙන්දා වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව බලයලත් වෙළෙන්දා විසින් නියම කරන ලද සියලු අදාළ ලේඛන හා තොරතුරු, බලයලත් වෙළෙන්දා වෙත ඉදිරිපත් කළ යුතු බවට ද ;

නිවේදනය කරනු ලැබේ.

(3) (1) වැනි ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසරයට අනුව, කරනු ලබන සියලු ම ගෙවීම් ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක් ($100,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු බවට නිවේදනය කරනු ලැබේ :

එසේ වුව ද, ඒ අවසරයට අනුව ඉහත නිශ්චිතව සඳහන් කර ඇති සීමාව ඉක්මවා යන යම් ගෙවීමක් කිරීමේ දී, විනිමය පාලකවරයාගේ පූර්ව අනුමතය ලබාගත යුතු වන්නේ ය.

මේ නියමයේ කාර්යය සඳහා "ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික" යන්නට, විනිමය පාලන පනත යටතේ 1972 අප්‍රේල් මස 21 වැනි දින අංක 15007 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විධානයෙහි ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

01-135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.